පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.25 පැය 0645 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 140 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**කේරළ ගංජා තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය නාශක කායර්ංශය යාපනය ඒකකය.**

වැඩ බලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදු කර ගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාලව, 2025.01.24 වන දින උදෑසන කාලයේ පලාලි පොලිස් වසමේ ඇන්ටනිපුරම් වෙරළ තීරයේදී පොලිස් මත්ද්‍රව්‍ය නාශක කායර්ංශ යාපනය ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **කේරළ ගංජා කිලෝ 101 ග්‍රෑම් 833ක් සන්තකයේ තබා ගැනීම හා ජාවාරම් කිරීම සම්බන්ධයෙන් සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පලාලි පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 67ක් වන වාමුනෙයි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම ගංජා තොගය පොහොර බෑග් 05ක බහා තිබී ඇති අතර පලාලි පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

වැටලීමට අදාල ඡායාරූප



**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**